# දැන්වීමයි

# කඩිගමුව දුම්රිය පාළම අළුත්වැඩියාව සඳහා රඹුක්කන - මාවනැල්ල මහා මාර්ගය වසා තැබීම

රඹුක්කන - මාවනැල්ල මාර්ගයේ පිහිටා ඇති කඩිගමුව දුම්රිය උමං පාලම ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු සිදු කිරීම සඳහා කටයුතු සූදානම් කර තිබේ.

ඒ අනුව මෙම ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කිරීම සඳහා කඩිගමුව දුම්රිය පාලම අසලින් **රඹුක්කන - මාවනැල්ල (B385)** මහා මාර්ගය 2026.05.15 වන දින පෙ.ව. 06.00 සිට 2026.05.20 දින අළුයම 05.00 දක්වා කාල සීමාව තුල **දින පහක් තාවකාලිකව වසා තැබීමට** සිදුවන බව කාරුණිකව දන්වා සිටිමි.

ඒ කාලය තුල පහත සඳහන් විකල්ප මාර්ගය භාවිතා කරන මෙන් ඉල්ලා සිටිමි. ඒ සම්බන්ධයෙන් ඇතිවන අපහසුතාවය පිළිබඳව කණගාටුව ප්‍රකාශ කරන අතර මෙම කටයුත්ත සඳහා ඔබගේ සහයෝගය අපේක්ෂා කරන බව ද කාරුණිකව දන්වා සිටිමි.

<u>විකල්ප මාර්ගය</u>

- රඹුක්කන - කෑගල්ල මාර්ගයේ දලුක්ගල හන්දියෙන් හැරී දලුක්ගල කිරිවන්දෙණිය මාර්ගයේ ගමන්කොට කිරිවන්දෙණිය හන්දියෙන් කඩිගමුව - අන්නාසිගල මාර්ගය භාවිතා කර කඩිගමුව දෙසට ගමන් කළ හැක.
- එසේම, කඩිගමුවේ සිට ගමන් කිරීමේදී ඉහත මාර්ගය ආපස්සට භාවිතා කර රඹුක්කන දක්වා ගමන් කල හැක.

අධ්‍යක්ෂ ජනරාල්,
මාර්ග සංවර්ධන අධිකාරිය.